# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-03-01 වන දින පස්වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
5. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
6. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී සංගණන නිලධාරීන්ගේ දිවුරුම් ප්‍රකාශය , ගණන්ගන්නා නිලධාරීන්ගේ අත්ත පත්‍රය සහ පුහුණුවීමේ පංති සඳහා කැඳවීමේ ලිපිය අවශ්‍ය පිටපත් ප්‍රමාණයන් දෙපාර්තමේන්තු වේ මුද්‍රණ අංශයෙන් මුද්‍රණය කිරීමට තීරණය විය.

03. කෘ සං 2 උපලේඛන මගින් රැස්කෙරෙන තොරතුරු ගණන්ගැණිම අවසන් වූ විගසින් ගණන්ගන්නා නිලධාරීන් ලවා සකස් කරවා ගැනීමට නියමිත සාරාංශ වාර්තාව සඳහා යොදාගැනීමට කලින් වතාවේ ඉදිරිපත් කළ කෘ සං 4 නම් වූ ආකෘතියේ සංශෝධිත ආකෘතිය සලකා බැලිණ. කෘ සං 4 න් සාරාංශ ගත කෙරෙන ප්‍රශ්න වල කෘ සං 2 හි යොමු අංක ආකෘතියේ තීරු වල සඳහන් ක්‍රීම යෝග්‍ය යැයි යෝජනා වුවද මෙම ආකෘතිය පිරවීම සම්බන්ධව දෙවන පුහුණු පංතියකින් උපදෙස් දීමට තීරණය කොට ඇති බව සහ උපදෙස් පොතේ ද සවිස්තරව දක්වා ඇති බැවින් එසේ අංක ඇතුලත් නොකිරීමට ද තිරණය විය. එහි දී කලින් රැස්වීමේ දී යොජනා කල වැදගත් වෙනස්කම් සියල්ල අනුව සැකැසුණු මෙම සංශෝධිත ආකෘතිය වඩා සුදුසු යැයි තීරණය විය.

04. සංගණනයේ දෙමළ භාශාවෙන් ලිපිලේඛන කටයුතු සහ උතුරු නැගෙනහිර පළාත්වල කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ වී තනබාලසිංහම් මහතාගේ සේවය ලබා ගැනීම අවශ්‍ය බැවින් දැනට සතියකට දින දෙකක් ඒ මහතාගේ සේවය ලබා දීමට තීරණය විය.

05. දැනටමත් මුද්‍රණ කටයුතු සඳහා ලබා දී ඇති ආකෘතීන් සියල්ල ~~රාජ්‍යභාෂා~~ දෙපාර්තමේන්තුව වෙත යවා දෙමළ පරිවර්තනයන් කර ගැණිමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ගලහිටියාව මහතාට දැන්වීමට තීරණය විය.

06. සංගණනයේ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් පිටපත් ලක්ෂයක් මුද්‍රණය කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා සුදුසු චිත්‍රයක් යොදාගැනීමට අවශය බව දන්වන ලදි. පාසැල් ළමුන් දැනුවත් කොට ඒ තුලින් ගොවි ජනතාව වෙත සංගණන පනිවුඩය ගෙනයාමට අදහස් කොට ඇති බව දන්වන ලදි. සංගණන පනිවුඩය වඩා පුළුල් ලෙස සියළුමදෙනාට ලබා දීමේ අරමුණෙන් එය දෙපාර්තමේන්තු වෙබ් පිටුවේ දැක්වීමට පියවර ගතයුතු බව තීරණය විය.

07. සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශය වන පෑන් ලිපි ලේඛන ෆයිල් කවර ආදිය දිස්ත්‍රික් මට්ටමින් මිලදී ගැනිමට හැකිවන අයුරින් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ වෙත මුදල් ප්‍රතිපාදනයන් ලබාදීම වඩා පහසු සහ යෝග්‍ය එකක් වනු ඇතැයි හැගෙන බැවින් ඒ සඳහා අවශ්‍ය මූලික ඇස්තමේන්තු දැනමටත් පිළියෙල කරමින් පවතින බව කමිටුවට දන්වන ලදුව එයට එකගත්වය පල කෙරිණ.

08. සංගණනයේ පුහුණු පංති සඳහා සහභාගිවන අයට කෑම බීම සැපයීම ගෙවීම අධීක්ෂන නිලධාරීන් ගණන්ගන්නා නිලධාරීන් ආදී කරුණු රැසක් ඉදිරි රැස්වීම් වලදී සාකච්ජා කොට අවසන් තීරණයන්ට එළඹීමට නියමිතය.

09. මීලඟ රැස්වීම 2002 මාර්තු 07 වන දින පස්වරු 2.30 ට කැඳවීමට එදින සාකච්ජාව සඳහා වන උපලේඛනයේ කෙටුම්පතක් ද බෙදා දෙන ලදි.

පස්වරු 4. 45 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
ජේ. සංඛ්‍යාලේඛනඥ